ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංක : PS/GPA/චක්‍රලේඛ/21/2020
14.05.2020

**අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**දිස්ත්‍රික් ලේකම්වරුන්**
**ප්‍රාදේශීය ලේකම්වරුන්**
**රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්**

**කෝවිඩ්-19 වසංගතය පවතින කාලය අතරතුර කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති රාජ්‍ය ආයතන විසින් මෙහෙයුම් විමධ්‍යගතකරණය තුලින් රාජ්‍ය සේවාවන් ප්‍රශස්ත අයුරින් පවත්වාගැනීම**

කෝවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් පැනවූ සීමා ලිහිල් කරමින් ජන ජීවිතය ක්‍රමානුකූලව යථා තත්වයට පත් කිරීම උදෙසා රජය විසින් පියවර ගනිමින් සිටි. කෙසේවෙතත්, පාසල් නැවත විවෘත කිරීම, ප්‍රවාහන මාධ්‍යයන් ප්‍රතිසංවිධානය කර යථා තත්වයට පත්කිරීම, නැවත සේවා ආරම්භ කිරීමත් සමඟ නගරාශ්‍රිතව ඇතිවන තදබදය වළක්වාලීම වැනි අභියෝගාත්මක හේතු නිසාවෙන් සාමාන්‍ය ජන ජීවිතය ප්‍රකෘති තත්වයට පත් කිරීමට කලක් ගත වනු ඇත. රජයේ සේවා සැපයුම් කටයුතු තවමත් විශේෂයෙන්, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලට අයත් ප්‍රදේශවලට කේන්ද්‍රගත වී ඇත. ඒ අනුව, නගරවලට ජනතාව ඇදී ඒම අවම කිරීම සඳහා රජයේ සේවාවන් විමධ්‍යගත කිරීමට කටයුතු කෙරේ. එම නිසා, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි පිහිටා ඇති අමාත්‍යාංශ, රජයේ ආයතන හා ව්‍යවස්ථාපිත සංස්ථාවල ප්‍රධාන කාර්යාලීය මෙහෙයුම් පවත්වාගෙන යාමේදී පහත මාර්ගෝපදේශයන් පිළිපැදීම සිදු කල හැක.

**1.0 සේවාවන් සැපයීමේ ක්‍රමවේදය**

i. රාජ්‍ය ආයතන, ඒවා පිහිටුවා ඇති ස්ථානය නොසලකමින්, ස්වකීය සේවාවන් සෑම විටම මහජනතාව වෙත සපයන බවට සහතික විය යුතුය. දිවයිනේ සෑම ප්‍රදේශයක් සඳහාම කාර්යක්ෂමව සේවා සැපයීම කාලීන අවශ්‍යතාවයක් බැවින් රාජ්‍ය ආයතනවල බලතල අදාල ප්‍රාදේශීය කාර්යාල වෙත නිසි ලෙස පවරා විමධ්‍යගත කිරීමෙන් එම ආයතන වල ධාරිතාවය ප්‍රශස්ත ලෙස භාවිතා කළ හැකිය.

ii. ඇමුණුම I හි හඳුනාගෙන ඇති පරිදි කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල පිහිටා ඇති, ප්‍රාදේශීය කාර්යාල හෝ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විමධ්‍යගතව මෙහෙයුම් සිදු කළ හැකි ආයතනවල ප්‍රධානීන්, තම කාර්ය මණ්ඩලය එම කාර්යාල වල සේවයේ යෙදවීමට පියවර ගත යුතු අතර ඉහළ මට්ටමේ සහ අනිවාර්ය කාර්යයන් ඉටු කිරීම සඳහා පමණක් ප්‍රධාන කාර්යාල වල අවම කාර්ය මණ්ඩලයක් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. මෙම ක්‍රමවේදය මගින් ප්‍රවාහන පහසුකම් අවම මෙම කාලසීමාව තුල සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ සේවාවන් වඩාත් පහසුවෙන් සපයා ගැනීමට පහසුකම් සැලසෙන අතර කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජනතාව ඒකරාශිවීම සහ වාහන තදබදය අවම කර ගත හැකි වනු ඇත.



ගාලු මුවදොර, කොළඹ 01 காலி முகத்திடல், கொழும்பு 01 Galle Face, Colombo 01
දුරකථන தொலைபேசி Telephones ++ 94 (0) 11 2354418 ++ 94 (0) 11 2473873
ෆැක්ස් தொலைநகல் Fax ++ 94 11 2446657
ඉ-තැපැල மின்-அஞ்சல் e-mail prsec@presidentsoffice.lk

iii. ඒ අනුව, මෙම වැඩපිළිවෙල යටතේ, ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරනු ලබන සාමාන්‍ය සේවා සැපයීමේ කාර්යයන් අදාල විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාල වෙත පැවරීම උපරිම ලෙස සිදුකළ යුතුය. ඊට සමගාමීව, ප්‍රධාන කාර්යාලයේ අවම කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන අනෙකුත් කාර්ය මණ්ඩලය අදාල විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය;මන්දයත් ආයතනයේ සේවා සැපයීමේ කාර්යයන් බොහොමයක් මෙම ක්‍රමවේදය යටතේ දිවයිනේ වෙනත් ස්ථානයක ක්‍රියාත්මක වන බැවිනි. එසේ කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීමේදී ඔවුන් පදිංචි ස්ථානයට ආසන්නව ඇති විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ යෙදවීමේ ඇති හැකියාව සැලකිල්ලට ගත යුතුය.

iv. ආයතන ප්‍රධානීන් විසින්, විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාලයන්හි කාර්යභාර නිලධාරීන් වෙත අවශ්‍ය අවස්ථාවල දී නීත්‍යානුකූල ක්‍රියා-පටිපාටින් අනුගමනය කරමින් බලතල පැවරිය හැකිය. අලුතින් පවරා ඇති කාර්යයන් ඉටු කරන අතරම සාධාරණ කාල සීමාවක් තුළ, විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාලවල දැනටමත් ඒකතු වී ඇති හා අසම්පූර්ණ වැඩ නිම කළ යුතුය.

v. ප්‍රධාන කාර්යාලය සහ විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාල අතර සන්නිවේදනය සහ ලිපි හුවමාරුව පහසු කිරීම සඳහා අන්තර්ජාලය, වෙබ් යෙදුම් සහ මෘදුකාංග මෙවලම් වැනි ඩිජිටල් මාධ්‍යයන් භාවිතා කිරීම හෝ හඳුන්වා දීම සඳහා අවශ්‍ය කටයුතු ආයතන ප්‍රධානීන් විසින් සිදුකල යුතුය.

vi. කොළඹ නගරය තුල අවම කාර්ය මණ්ඩලයක් දිනකට රදවාගත යුතු අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතනයන්, එක් දිනක් තුල සීමිත සංඛ්‍යාවක් සිටින පරිදි තම කාර්ය මණ්ඩලය කණ්ඩායම් වශයෙන් කැඳවීමට කටයුතු සංවිධානය කරන ලෙස ආයතන ප්‍රධානීන් වෙත උපදෙස් දෙනු ලැබේ. ඒ අනුව, සාමාන්‍යයෙන් 1/3 ක කාර්ය මණ්ඩලයක් චක්‍රීය පදනමක් මත එවැනි කාර්යාලවල සේවයට වාර්තා කරනු ඇත.

vii. නව සේවා සැපයුම් විධිවිධාන සහ ස්ථාන පිළිබඳව, ජනමාධ්‍යය සහ වෙනත් සන්නිවේදන මාධ්‍යයන් හරහා ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත් කළ යුතුය.

viii. රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ගත යුතු බැවින් ඉහත පරිදි සේවයේ යෙදවීම සම්බන්ධ කටයුතු සඳහා අමතර වියදම් දැරීම සිදු නොකළ යුතුය. ආයතන සතු වාහන, පරිගණක ඇතුළු සම්පත් සුදුසු පරිදි නැවත බෙදා හැරීම මගින් විමධ්‍යගත/ප්‍රාදේශීය කාර්යාලවල සේවයේ යොදවන කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය පහසුකම් සම්බන්ධීකරණය කළ යුතු වේ.

ix. තවද, මාගේ 2020.04.18 දිනැති අංක: PS/GPA/චක්‍රලේඛ/20/2020 දරණ "කෝවිඩ් -19 වෛරසය පවතින කාලය අතරතුර දෛනික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික් විවෘත කිරීමේදී රාජ්‍ය නිලධාරීන් විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ" චක්‍රලේඛයේ අදාළ විධිවිධාන සහ, ප්‍රජාව තුළ කෝවිඩ් -19 පැතිරීම වැළැක්වීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සඳහා ද ඔබේ අනුකූලතාවය අපේක්ෂා කෙරේ.

**අත්.කළේ/පී බී ජයසුන්දර**
ජනාධිපති ලේකම්

පිටපත්: **අග්‍රාමාත්‍ය ලේකම්**
**අමාත්‍ය මණ්ඩලයේ ලේකම්**
**විගණකාධිපති**